18654
97/07/01

# රිදීවිහාරය

එච්.එම්.පී.බී.හේරත්

18654

# ප්‍රස්ථාවනාව

රිදී විහාරය රහතන් වහන්සේලා උදෙසා ගොඩනැංවුණු ස්වභාවිකව නිර්මාණය වු ගුහා සංකීර්ණයක් සහිත ආරාමයකි. රජතලෙන රිදි ලෙන ආදී නාමයන්ගෙන්ද මෙම විහාරය හඳුන්වනු ලැබේ. ඓතිහාසික හා කලාත්මක අතින් ඉතා වැදගත් තැනක් ලෙස මෙම ස්ථානය ඉතිහාස ගත වී තිබේ. ක්‍රි:පු යුගවල සිට මෙම ස්ථානය ආරණ්‍ය වාසයක් ලෙස පැවතුණ බව එහි සඳහන් බ්‍රාහ්මී සෙල්ලිපි වලින් සනාථ වී තිබේ.*[1] ක්‍රි:පු 2වන සියවසේ දුටුගැමුණු යුගයේ සිට මෙම ස්ථානයට විශේෂ රාජ අනුග්‍රහයක් ලැබි තිවුණු බව මෑතකාලින ග්‍රන්ථයක් වු රිදි විහාර වංශයේ සඳහන් වුවත් එය සත්‍ය තොරතුරක් ලෙස ගිනිය නොහැක එහෙත් අමණ්ඩගාමිණි අභය රජතුමා (ක්‍රිව 21 සිට 29 ) කාලය තුළදි රිදි විහාරය ගොඩනැංවු බව සෝමපාල ජයවර්ධන මහතා පවසයි.*[2] මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ ( ක්‍රි:ව : 1748 - 1782 ) මෙම ස්ථානයට විශේෂ රාජ්‍ය අනුග්‍රහයක් ලැබුණු අතර*[3] එම යුගයට අයත් බිතුසිතුවම් හා බුදුපිළිම රාශියක් මෙහි දක්නට පුලුවන. එමෙන්ම ප්‍රතිමා ප්‍රමාණ මුල ධර්ම ගුරුකොටගෙන නිර්මාණය කළ බුදු රුවක සටහන් රිදී විහාරයේ දක්නට ලැබේ. 11වන සියවසේ පමණ ප්‍රචලිත ප්‍රතිමා ප්‍රමාණ මුල ධර්ම පොත් ගුරුකොටගෙන මෙම රූපය නිමවී ඇති බව පෙනේ.

අනුරාධපුර යුගයේ වාස්තු විද්‍යා ලක්ෂණයන් පිළිඹිබුකරණ කුඩා ප්‍රමාණයේ විහාර ගෘහයක් මෙහි දක්නට ඇතත් වරින් වර ප්‍රතිසංස්කරණය කරණ ලද පොළොන්නරු යුගයේ අවසාන කාර්තුවේ දී හෝ යාපහුවේ ඇති ගොඩනැගිලිවලට නෑකම් කියන විහාර ගෘහයක් මෙහි ඇත. මෙය ඉන්දියානු වාස්තු විද්‍යා ප්‍රමාණ මුලධර්ම වලට අනුකූලව නිර්මාණය වී ඇති ගොඩනැගිල්ලකි. මෙම ගොඩනැගිල්ලේ ඇති සුවිශේෂ ලක්ෂණය නම් සියලුම අංගයන් ගල් කුට්ටිවලින් නිම වී තිබිමයි.

මහනුවර යුගයේ උඩරට චිත්‍ර සම්ප්‍රදාය යැයි ප්‍රචලිත සිතුවම් කලාවේ දක්නට ඇති මුලධර්මයන් සහිතව බිතුසිතුවම් රාශියක් මෙහි ඇත. පුරාවිද්‍යාත්මක වශයෙන මෙම ස්ථානය ඉතාම වැදගත් බව අපේ වංශ කථාවල සඳහන් වේ.*[4] එම නිසාම පුරාවිද්‍යාදෙපාර්තමේන්තුව ද මේ ස්ථානයේ ඇති කලාත්මක වශයෙන් උසස් ගොඩනැගිලි හා සිතුවම් සුරැකීමට උනන්දුවක් දක්වා තිබේ එහෙත් එම උනන්දුව ඉතාම අල්ප බව මගේ හැඟීමයි. නූතන පුරාවිද්‍යඥයින් සහ සංරක්ෂණ විද්‍යාඥයින් විසින් ලොව ඇති ඓතිහාසික වටිනාකමකින් යුතු කලාත්මක ගොඩනැගිලි සහ සිහිවටන සුරැකිරමේ ව්‍යාපාරයට උරදෙමින් සිටි. එය අනාගත පරම්පරාව සඳහා සුරැකිව තබාගෙන ජාතියක ශ්‍රී විභූතිය පෙන්වීමට දරණ ප්‍රයත්නයකි.

එම නිසා මේ රිදී ලෙන සංරක්ෂණය කළ යුතු ව ඇත. ක්‍රමයෙන් ජරා ජීරණ වෙමින් හා ගරා වැටෙමින් ඇති සංස්කෘතික දායාදය රැකගැනීම අප සතු වගකීමකි. මේ තුළින් ලංකාවේ හෙළයන්ගේ ප්‍රෞඪත්වය කුමක්ද යන්න ලොවට කියා පෑමට අපට හැකියාව ලැබේ.

---

පාදක සටහන්

1 පරණවිතාන මහාචාර්ය සෙනරත්. ඉපැරණි බ්‍රහ්මි ලිපි, පිට, 69.

2 ජයවර්ධන සෝමපාල . ලංකාවේ නටබුන්, පිට, 114 .

3 කුමාරස්වාමි ඒ. කේ. මධ්‍යකාලීන සිංහල කලා, පිට, 172.

4 විජේසිංහ මුදලිඳු එල් සී. මහාවංශය පිට, 106 - 107